සිද්ධි SIDDHI

# අදියුරු ජයන්ත චන්ද්‍රසිරිගේ බැල්ම වැටුණු අන්තෝනි

1980 වසරේදී කොල්ලුපිටියේ ගාළු මුවදොර ග්‍රාන්ට් වෙළඳ ප්‍රචාරක ආයතනයට පාසැල් දිවිය අවසන් කර තරුණයන් දෙදෙනෙකු රැකියාවට එනවා. ඉන් එක් අයෙක් මා වන අතර, අනෙකා ජයනාත් බෝදහන්දියි. දැළි රැවුල යාන්තමට පෙනෙන ලාබාලයන් වූ අප දෙදෙනා කලා අධ්‍යක්‍ෂක මහින්ද ජීවානන්ද හා රවී බාලසූරිය ගේ ගුරුහරුකම් යටතේ සේවය කරගෙන යනු ලබනවා. ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රචාරක මධ්‍යයේ විසල් රුක වූ රෙජී කන්දප්පා මහතාගේ ආයතනයේ වැඩ කටයුතු කිරීමත්, ඔහුගෙන් ලද කාරුණිත්වය හා මහින්ද ජීවානන්ද මහතාගේ මඟ පෙන්වීම යටතේ තම අනාගතය හරියාකාරව භුක්ති විඳින්නට අප දෙදෙනාටම අවස්ථාවයි උදාවන්නේ.

එකල "කළු සිංහයා" නමින් ප්‍රසිද්ධ වූ ජිනප්‍රේම බෝදාහන්දි දිවයිනේ සිටි සුප්‍රකට චිත්‍ර ශිල්පියෙක්. ඒ ජයනාත් බෝදාහන්දිගේ පියාණන්. සිත්තර පුවත්පත ආරම්භයේදී "කළු සිංහයා" චිත්‍ර කථාව ඔහුගේ වීමත්, මුළු මහත් රසික ප්‍රසාදයක් දිනූ නව ආරක චිත්‍ර කතා මාලාවක් වීමත්, සිත්තර ඉතිහාසයට එකතු වීමක්.

ජයනාත් බෝදාහන්දිට අපි හැමෝම වගේ කතා කළේ "බෝඩි" කියලා. ඔහුගේ වෙළඳ ප්‍රචාරක ශිල්පී වැඩට අමතරව චිත්‍ර කතා පත්‍ර කිහිපයකටම චිත්‍ර නිර්මාණය කළා.

බෝඩිගෙත් මගෙත් හිතවත්කම 80 න් ආරම්භ වී අදටත් දුර යන අතීතයක්. ග්‍රාන්ට් ආයතනයෙන් විසිර යන අප නැවත කාලයකට පස්සේ මුණ ගැසෙන්නේ ෆීනික්ස් වෙළඳ ප්‍රචාරක අධිපති අර්වින් වීරක්කොඩි මහත්මාගේ ෆීනික්ස් වෙළඳ ප්‍රචාරක ආයතනයේදී.

ඒ වන විට ඔහු එහි චිත්‍රාගාර කළමනාකරු හා කලා අධ්‍යක්‍ෂක ධුරය හොබවනවා. මා ද 1990 දී කලා අධ්‍යක්‍ෂකවරයෙකු ලෙස එම ආයතනයට සම්බන්ධ වෙනවා.

සුන්දර අතීතයට තවත් යමක් එකතු වන්නේ මෙතැනින්. "අන්තෝනිගේ ආරූඪය" පටන් ගැනෙනුයේ මෙතැනින්. අප චිත්‍රාගාරයේ සිටින ප්‍රවීණයන් වූ පුලස්ති එදිරිවීර, ලකී ලියනගේ, ජීවක ජයසිංහ, හේමන්ත ගුණවර්ධන, රෝහණ හඳුන්නෙත්ති, සජිත් බැද්දේවිතාන, මාධව වික්‍රමසිංහ, සරත් මාකලන්ද, බැසිල් කුරේ වැන්න වුනට හරි හැටි නිදන්නට වුණාදෝ සැක සහිතය.

යමකට අත ගැසූ බෝඩී එය නොනවත්වා කරගෙන යන්නට යුහුසුළු වෙයි. ආයතන ප්‍රධානියාගේ ලැබෙන කාරිය දේවකාරිය මෙන් කරන්නට යෑම ඔහුගේ උත්සාහයයි. මේ නිසාම අප සියල්ලන්ටම නිදි මරන්නට ආයතනයේ රැය පහන් කරන්නට සිදු වෙනවාය.

"මචං, බෝඩීගේ නිදි නහර අයින් කරලා මගේ හිතේ." පුලස්තිගේ සිනාමුසු කතා බහට අනෙකුන්ගේ ප්‍රතිචාරය ලැබෙන්නේ ඇස් කොණකින් දෙන ඉඟියකිනි.

"දැන් උඹලට යන්නනේ අවශ්‍ය.... පලයල්ලා මං මේක තනියම කරගන්නම්.... සජ්ජා උඹ මාත් එක්ක හිටපං ඒ ඇති." බෝඩීගේ නෝක්කාඩු වූ වචන පෙළ දිගහැරේ.

"කියනවම නං ඉතිං ඉන්නම්. අඩුපාඩුත් ලැබේවිනේ." ලකී ලියනගේ ඇඟිල්ලකින් මේසයට තට්ටුවක් දමමින් රාත්‍රියට අවශ්‍ය කළමනා ගැන ඉඟියක් කරයි. "හරි. හරි. ඒවා ලැබේවි. ඉස්සෙල්ලා වැඩේ කරලා ඉඳපල්ලා." බෝඩී අනෙක් සඟයන්ටද බලාපොරොත්තු ඇති කරමින් රාත්‍රී ඉන්නා පිරිසට අවශ්‍ය කළමනා ගන්නට ප්‍රතිපාදන ගන්නට "ජේයරාජ්" හමුවන්නට දිව යයි.

දින, සති, මාස ගානේ නිදි මැරීමේ නිමාවක් නොවන කාලයක් නිර්මාණය වන්නේ, ආයතනයට ලැබෙන විශාල වූ වැඩ ප්‍රමාණය අනුවය. ඒ බොහෝ දේ වගකීමෙන් බලා ගන්නට කරන්නට බෝඩී සමත් වීම අද දවසටද හරි යමක් කිරීමේ පාඩම බෝඩී අපට කියා දෙයි.

ඒ වැඩ කටයුතුවල ආවේශය, ආරූඪය නිසාම ඔහුගේ ගමනද අනාගතය සුභදායී කරගන්නට රුකුල් දෙයි.



හේමන්ත,මම,ජීවක,බෝඩී ෆීනික්ස්
වෙළඳ ප්‍රචාරක ආයතනයේදී



සති අන්තය අප බොහෝ දෙනා ගත කරන්නේ බලපිටියේ මාදු ගඟේ බෝට්ටු සවාරියේ හෝ බෝඩීගේ නිවහනේය. බෝඩීගේ අම්මා පිසින ආහාර වේලක රස බලන්නට සැවොම සැදී පැහැදී සිටී. මුං ඇට පිරවූ දැල්ලන්, අළුත් මාළු නානා ප්‍රකාර ව්‍යංජන රස කුස පුරවයි. අනෙකුත් රස මසවුළුද පිළියෙළ කරන බිරිඳ නයනා ගේ ආගන්තුක සත්කාර විඳින්නටත් හැකි වන්නේ අපේ මිත්‍රයා සපිරි පිරිවර සමඟ සාජ්ජ පවත්වන්නට හිතවත්කම් පවත්වන්නට අතිශය කැමැත්ත පෙරදැරි කරගෙනය. මේ දේවලට "නයනා" ගේ අනුමැතිය ලැබීම භාග්‍යයකි. ඇය කිසි දිනෙක මාර්ග බාධක නොදැම්මාය.

**බෝඩීගේ ඇඟට ඇතුල් වූ යක්ෂයා අන්තෝනී තුළින් එළියට එන්නේ බොහෝ පිරිසකගේ ප්‍රශංසාව මධ්‍යයේය.**


වරෙක මාදු ගඟේ බෝට්ටුව පෙරලෙන්නට ගොස් නොගිලී බේරුණේ අපේ වාසනාවකටය. එකවරම රියදුරු "ජබොස්" ගා වතුරට වැටී නොපෙනී ගියාය. "කප්පියා වතුරේ...... කප්පියා වතුරේ....." යයි එකෙකු කෑ ගසයි. නිමේෂයක සිදුවීමකි. අතපය ගසා බෝට්ටු රියැදුරා නැවතත් බෝට්ටුවේ එල්ලුනි. "මං පොඩි විහිළුවක් කළේ ඔහෙලට. මිරිජ්ජේ ඕනෑ පදං කරක් ගහලා තියෙනවා." සෙම පෙරමින් බෝට්ටුවට ගොඩවෙයි. විහිළුව කෙසේ වෙතත් රියැදුරා නොසෑහෙන්න බීමතින්ය.

රහමෙර පානය අපේ උන් බොන අතරේ රියැදුරා පිනවන්නට නොසෑහෙන්න පොවලාය. සියල්ලෝම බේරීම දේව ආශිර්වාදයකි.

දිනෙක බෝඩී සියල්ලන්ටම කියා සිටින්නේ දුරකතන ඇමතුම් ගැනීමේදී පරිස්සම් වන ලෙසයි. "ඔන්න කට්ටියටම මේ කියන්නේ කෝල් එකක් ආවොත් අද නම් මම ඉන්නවා කියන්න එපා. කරදර කාරයෙක් අද කෝල් එකක් දේවී ශුවර් එකටම..... සජ්ජා මං ඇහුවොත් නැහැයි කියපං..." සජිත් බැද්දේ විතානටද උපදෙස් දෙයි.

"නාථ මාර කොන්ත්‍රාත්තුවක් නේ දුන්නේ. දැන් ඒකත් මම ඇහැ ගහගෙන ඉන්න එපැයි." එසේ කියා සජිත් ලකී ලියනගේ දෙසට හැරේ.

ලකී ලියනගේ ගේ මුහුණේ දිස්වෙන රටාව මා ලියනවාට වඩා හැබැහින් දකින්නට වටිනවාය. ඒ මන්ද යත්, මුහුණේ සැඟවුණු උපහාසයත්, යමෙකු "බයිට් " කිරීමට හැකි විශේෂ දක්ෂකමක් පෙනෙන නිසාය.



පුලස්ති එදිරිවීර ගේ සිතුවමට හසුවූ අන්තෝනි

කාලය ගෙවී යයි. කිසිම කෙනෙකු බෝඩීගේ මේසයේ ඇති දුරකතනයට ඇමතුමක් නොදේ. බෝඩී හදිසි වැඩ කටයුතු වලට දුව විත් විඩාව මඟ හරවා ගැනීමට මොහොතක් සිය අසුනේ හිඳ ගත්තා පමණි. දුරකථනය නාද වේ. අපි එකිනෙකාගේ මුහුණු බැලුවෙමු. ඔහු රිසීවරය කනේ තබා ගත්තේය.

"ආ..... බෝඩී ද? අද බෝඩී වැඩට ඇවිත් නෑනේ...." ඔහුගේ පිළිතුර වෙයි.

තවත් මොහොතක "නෑ..... නෑ..... මං අද වැඩට ඇවිත් නෑ..." දෙවන පිළිතුරයි. ඉන්පසු රිසීවරය තබා නළලට ඔහු අතින් කිහිපවරක් ගසා ගත්තේය.

අපට දැන් පැහැදිලිය. අනෙක් පසින් අසන්නට ඇත්තේ "ඔය බෝඩී නේද කතා කරන්නේ කියාය." බෝඩීගෙන් සිදු වූ එවන් සුන්දර අවස්ථා බොහෝය.

රාජකාරී කටයුතු අතරතුරේ උසුළු, විසුළු, වාද විවාද එමට වුවද දවස අවසානයේ සවස් යාමය වන විට ඒ ඒ සියල්ල මැකී යයි. "අද මොකද කරන්නේ බෝඩී.... රෑට අපි ඉන්න ඕනිද ?" ලකී ලියනගේ වචනය දමයි.

ඉතිං...... උඹලට මං කියන්නම ඕනෑද ඉන්න කියලා. හුරතල් විදියට කට කොනකින් සිනාසී බෝඩී කියන ඒ වචන පෙළ අදද මැවී මැවී පෙනේ.

පසුගිය මස මා නිවාඩුවට ලංකාවට ගිය විගස මුණ ගැසුණේ ඒ මිතුරු කැළ හා බෝඩී නොව අන්තෝනීවය.

එතරමටම බෝඩී කියන වචනයට වඩා කියැවුණේ අන්තෝනී ගැනය. ඒ වන විට ප්‍රවීන චිත්‍රපට අධ්‍යක්‍ෂක ජයන්ත චන්ද්‍රසිරි මහතා බෝඩී -අන්තෝනී කර හමාරය. තාත්වික රඟපෑමකි. ඉහළ ප්‍රේක්‍ෂක ප්‍රතිචාර, එක් දවසකින් එක් චිත්‍රපටයකින් බෝඩී රසික පිරිස් වැළඳගෙනය. ආඩම්බරයකි. උත්සාහයක ප්‍රතිඵලයකි. අවුරුදු ගණනාවක් පුවත්පත රූපවාහිනිය විවිධ මාධ්‍ය ඔස්සේ වෙළඳ ප්‍රචාරණය හා නිර්මාණශීලී නිර්මාණ කළ බෝඩීට මෙවැනි චරිතයකට ඇතුල් වීම එතරම් අපහසු නැත. ඔහු සියලු දේ දැක සියලු දේ විඳ ඇත.

බෝඩීගේ ඇඟට ඇතුල් වූ යක්ෂයා අන්තෝනී තුළින් එළියට එන්නේ බොහෝ පිරිසකගේ ප්‍රශංසාව මධ්‍යයේය. ප්‍රේක්‍ෂක ප්‍රතිචාර ලැබෙන්නේ ඒ චරිතයට බෝඩී විසින් උපරිම සාධාරණය ඉෂ්ඨ කොට ඔවුන් අන්තෝනිගේ ලෝකයට ගෙන යන බැවිනි. ප්‍රවීණ අධ්‍යක්‍ෂක ජයන්ත චන්ද්‍රසිරි මහතාගේ "ඝරසරප" බැල්ම නොවැටෙන්නට මේතරම් හරියක් කරන්නට බෝඩීට පහසු වන්නේ නැත. **සුභ පැතුම් මිත්‍රයා... ආයෙත් අමතක නොවන චරිතත් අරන් එන්න.**

කල්දෙමුල්ල
kaldemulla@gmail.com